# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
### 2012 දෙසැම්බර් / 2013 ජනවාරි

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල - SINH E2025

### සංස්කෘතිය, ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය

1 කොටසින් එක් ප්‍රශ්නයක්ද, 11 කොටසින් එක් ප්‍රශ්නයක්ද, 111 කොටසින් ප්‍රශ්න දෙකක්ද ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස

01. උපකරණ තැනීමේ භාවිතය මඟින් මානව සංස්කෘතිය ස්ථාපිතවීමෙහි ලා ඇති කෙරුණු බලපෑම පිළිබඳ විමර්ශනයක් කරන්න.

02. උපසංස්කෘතියක් යනු කවරේ ද්'යි පැහැදිලි කොට ශ්‍රී ලංකාවේ උපසංස්කෘතීන් පිළිබඳ ඔබේ නිරීක්ෂණ ඉදිරිපත් කරන්න.

**නැතහොත්**

පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** විභාග කරන්න.

අ) ජනප්‍රිය සංස්කෘතිය
ආ) සමාජානුයෝජනය
ඇ) සාරධර්ම
ඈ) සංස්කෘතික අනන්‍යතාව

03. ''ලංකාවේ අභිමානවත් වාරි සංස්කෘතිය සුපුෂ්පිත වූයේ ශිල්පීය ඥානය, පාරිසරික දැනුම හා සාමූහිකත්වය ද හේතු කොට ගෙන ය.' විමසන්න.

**නැතහොත්**

පෘතුගීසි බලපෑමෙන් සිංහල සංස්කෘතියට එක් වූ නවාංග පැහැදිලි කරන්න.

## 11 කොටස

04. ජනශ්‍රැතිය හා ජනජීවිතය අතර ඇති සබඳතාව පහදන්න.

05. මිනිසාගේ බුද්ධිය, දැනුම හා ශඨකපටකම් කෙරෙහි සිංහල ජනකථාකරුවා දැක්වූ ආකල්පය කෙබඳු ද්'යි අදාළ නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

06. 'සිංහල දරු නැළවිලි ගීවල පවා ශ්‍රී ලාංකේය ජන ජීවිතයේ පිළිබිඹුවක් විද්‍යමාන වෙයි.' මේ විචාරක මතයට එකඟ විය හැකි ද්'යි විමසන්න.

**නැතහොත්**

පහත සඳහන් මාතෘකා අතරින් **එකක්** විමර්ශනය කරන්න.

අ) ප්‍රස්තාව පිරුළු
ආ) වී ගොවිතැන ආශ්‍රිත ජනකවි
ඇ) ජනප්‍රවාද

## 111 කොටස

07. 'භාෂාවක් කිනම් භාෂා පවුලකට අයත් වේද' යි නිශ්චය කිරීම පහසු කටයුත්තක් නොවේ.' සිංහල භාෂාව සම්බන්ධයෙන් මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව පිරික්සන්න.

නැතහොත්

සිංහලය ආර්‍ය්‍ය භාෂාවක් බවට විද්‍යමාන ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රාගත හා වාග්විද්‍යාත්මක සාධක පිළිබඳ විමර්ශනයක් කරන්න.

08. 'පණකුරු පසෙකි එද
ලුහුගුරු බෙයින් දස වේ
ගතකුරු ද වේ විස්සෙක්
වහරට යුහු සියබසැ'

මෙම ගීය නිශ්‍රය කර ගනිමින් සිදත් සඟරා අක්ෂර මාලාව පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක යෙදෙන්න.

09. 'සමාස' පිළිබඳ සිදත් සඟරාවේ ඉගැන්වීම් විමර්ශනය කොට විභක්ති සමාසය නිදසුන් සහිතව පහදන්න.

නැතහොත්

ආයාසී සන්ධි හා නිරායාසී සන්ධි හඳුන්වා සිදත් සඟරාවේ සන්ධි විග්‍රහය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

10. කාරක විභක්ති පිළිබඳ හැඳින්වීමක් කොට ක්‍රියා නිෂ්පාදනයේදී කාරකයන්ගේ දායකත්වය කෙබඳු දැ'යි පහදන්න.

********************************